**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව**

# 2020 නොවැම්බර් මස 29 දින මහර බන්ධනාගාරයේ ඇතිවූ සිදුවීම

# අතුරු නිර්දේශ

**හැඳින්වීම**

2020 නොවැම්බර් 29 වනදා සිට ඇති වූ සිදුවීම් වල ස්වභාවය තහවුරු කර ගැනීම සඳහා නොවැම්බර් 30 හා දෙසැම්බර් 01 යන දිනවල ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව මහර බන්ධනාගාරය නිරීක්ෂණය සඳහා යාම සිදු විය. හදිසි ප්‍රවෘත්ති වාර්තාවක් නැරඹීමෙන් පසුව 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 14 වන වගන්තිය යටතේ පැවරී ඇති වගකීම් ඉෂ්ඨ කරලීම සඳහා කොමිෂන් සභාව විසින් පරීක්ෂණයක් දියත් කෙරිනි. බන්ධනාගාරයේ අසහනකාරී තත්වයෙන් පසුව නිලධාරින්ට හා සිරකරුවන්ට දැඩි තුවාල සිදු කරමින් සහ නිළධාරින්දෙදෙනෙකු ප්‍රාණ ඇපයට තබා ගැනිම, සිරකරුවන් කිහිප දෙනෙකුගේ මරණ සිදු වි ඇති බවට වාර්තා විය. මෙම ප්‍රවෘත්තිය පළවීමෙන් අනතුරුව මහර රැඳවියන්ගේ අදාළ පවුල්වල සාමාජිකයන්ගේ දුරකථන ඇමතුම් ද කොමිෂන් සභාවට ලැබුනි. අනතුරුව සිරකරුවන්ට සන්නිවේදන පහසුකම් ඇති කිරීමෙන් පසුව රිමාන්ඩ් සිරකරුවන් කිහිප දෙනෙකුට ද කථා කෙරිනි. එහි ගිය අවස්ථා දෙකෙහිදී ම ස්ථානයට ඇතුල්වීමේ දී හා නිළධාරීන් සම්බන්ධ කරගැනීමේදී ප්‍රමාදවීම් රාශියකට මුහුණ පෑමට කොමිෂන් සභාවට සිදු විය. මෙයින් සමහරක් ප්‍රමාද වීම් සඳහා හේතු තේරුම්ගත හැකි වුවද සමහර ප්‍රමාදවීම් අනවශ්‍ය ඒවා වූ බව පෙනිණි - ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 11 (ඇ) වගන්තිය යටතේ මහජනයාගේ නිදහස උල්ලංඝණය වන අවස්ථාවක ඔවුන්ගේ සුබසිද්ධිය තහවුරු කරලීමට අදාළව ක්‍රියා කිරීමට කොමිෂන් සභාවට බලය පවරා ඇති බැවින් එවැනි සිදුවීම් ඇති වන අවස්ථාවල බලධාරින් වෙත බාධා නොවූ ප්‍රවේශයක් සහ බලධාරීන් පෙරළා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට දැනුම්දීමේ තත්වයක් ඇත. එසේ ගිය අවස්ථාවේ නිළධාරීන්, සිරකරුවන් හා ශෝකයට පත් පවුල්වල සාමාජිකයන් අපට මුණ ගැසිණි.

මෙම නිරීක්ෂණ චාරිකාව සහ එහිදී සිදුවූ අනාවරණයන්ට අනුව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 10, 11 හා 14 වගන්ති යටතේ වන කොමිෂන් සභාවේ වගකීම් ප්‍රකාරව වහා ක්‍රියාවට නැංවීම සඳහා මෙම අතුරු නිර්දේශ අප ඉදිරිපත් කරන්නෙමු. පරීක්ෂණය නිම වීමෙන් පසුව ඒ පිළිබඳ පරිපූර්ණ වාර්තාව හා අවසන් නිර්දේශ මාලාව නිකුත් කෙරෙනු ඇත.

**නිර්දේශ**

අ. ක්ෂණික

- **බන්ධනාගාරගත රැඳවියන් සංඛ්‍යාව අවම කිරීම**

සිරකරුවන් හා බන්ධනාගාර නිළධාරින් විසින් පැවසූ පරිදි ප්‍රමාණය ඉක්මවා සිරකරුවන් රඳවා තබා ගැනිම මගින් පොදුවේ අසහනකාරි තත්වයක් ඇති වි ඇති බවත් කොවිඩ් 19 වසංගතය පැතිරීමේ බිය මෙම තත්ත්වය වර්ධනය කිරිමට හේතු වී ඇත. 2020 මාර්තු, 2020 නොවැම්බර් මාසවලදී අප විසින් කරන ලද පණිවුඩ භුවමාරු සහ බන්ධනාගාර පිළිබඳව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා අධ්‍යයනයේ නිර්දේශ වලින් දන්වා සිටි පරිදි බන්ධනාගාරගතව සිටින පිරිස අවම කිරිම සඳහා කඩිනමින් පහත පියවර ගැනීම අත්‍යාවශ්‍ය වේ.

  - ඇප ලබා දිය හැකි වරදවල් වලට සම්බන්ධ රිමාන්ඩ් සිරකරුවන් නිදහස් කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම.

- ○ අනෙක් අය සඳහා හදිසි ඇප නඩුවාර පැවැත්වීම
- ○ ඇප ලබා දිය හැකි වරදවල් සඳහා සැකපිට අත්අඩංගුවට ගන්නා අය රිමාන්ඩ්ගත කිරීම නවතාලීම
- ○ කඩිනමින් මුදා හැරීමේ වැඩසටහන දියත් කිරීම

- **සිරකරුවන්ගේ සෞඛ්‍යය හා ප්‍රතිකාර -** කෝවිඩ් 19 ආසාදිත සිරකරුවන් වැලිකඩ බන්ධනාගාරයේ සිට මහරට මාරු කර එවීම හේතුවෙන් විරෝධතා හට ගැණුනි. මෙම යෝජිත මාරු කර එවීමට හේතුවෙන් බන්ධනාගාර නිලධාරින්ට මුහුණපෑමට සිදුවන අපහසුතාවලට අවධානය යොමු කරමින් අදාළ බලධාරීන් විසින් ඒ වෙනුවට සිරකරුවන් සඳහා වෙනම ප්‍රතිකාර මධ්‍යස්ථානයක් ආරම්භ කළේ නම් පසුව සිදු වූ මරණ සම්පූර්ණයෙන්ම වළක්වා ගත හැකිව තිබුනි. පීසීආර් පරීක්ෂණ සිදු කිරීමට අදාළව දිගු ප්‍රමාදයක් ඇති වන තත්වය තුල නව රෝගින්ට ප්‍රතිකාර ලබාදීම පිළිබඳව අපැහැදිලි තත්ත්වයක් පැවතිණි. වැඩිදුර කලබලකාරිත්වයක් ඇති විමට ඉඩ ඇති සිරකරුවන් අතර බිය නැති කිරිම සඳහා පහත දැක්වෙන පියවර හදිසි කරුණක් ලෙස ක්‍රියාවට නැංවිය යුතුය.

- ○ නවක සිරකරුවන් සියලු දෙනා බන්ධනාගාරගත කිරීමට පෙර පීසිආර් පරික්ෂණ සිදු කිරිම.
- ○ නවක සිරකරුවන් සඳහා නිරෝධායන තත්ත්වයන් තරයේ අනුගමනය කිරිම.
- ○ වෛරසය ආසාදිතව ඇති සියලු සිරකරුවන් හා රිමාන්ඩ් සිරකරුවන් සඳහා වෙනම ප්‍රතිකාර මධ්‍යස්ථානයක් ඇති කිරිම
- ○ මහර සිටින සියලු සිරකරුවන් පරික්ෂණ වලට භාජනය කිරිම
- ○ බන්ධනාගාර නිළධාරීන් නිරන්තරයෙන් පරීක්ෂා කිරීම හා ප්‍රතිකාර ලබා දීම.

**තොරතුරු ලබා දීම -** මියගිය පුද්ගලයන්, රාගම රෝහලට යැවූ තුවාලකරුවන් හෝ ඇප ලබාදුන් සිරකරුවන් පිළිබඳ තොරතුරු නොවැම්බර් 30 දින සවස 4 වන විටත් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට තහවුරු කිරීමට බලධාරින් අපොහොසත් විය. මෙයින් ගම්‍ය වන්නේ තම ආසන්නතමයන්ගේ තත්ත්වය පිළිබඳව පවුලේ සාමාජිකයන්ට දැනගැනීමට හැකියාවක් නොමැති බවයි. මෙම තත්වය ක්ෂණිකව නිවැරදි විය යුතුය.

- ○ මිය ගිය පුද්ගලයන්ගේ නම් ලැයිස්තු ගත කර ඔවුන්ගේ පවුල් වලට දැනුම් දීම.
- ○ මහර දී සිදු වූ තුවාල වලට ප්‍රතිකාර සඳහා රෝහල්ගත කර ඇති සියලු දෙනාගේ නම් ලබා ගැනීම
- ○ බන්ධනාගාරයෙන් පිටට රැගෙන ගොස ඇති අනෙක් සියළු දෙනා පිළිබඳ විස්තර වාර්තා කරගැනීම:
    - වෛරසය ආසාදිතව ඇති හා ප්‍රතිකාර සඳහා ගෙන ගොස් ඇති;
    - නිරෝධායනට ලක් කර ඇති
    - ඇප පිට නිදහස් කළ නමුත් අක්කරෙපත්තු නිරෝධායන මධ්‍යස්ථානයට ගෙන ගොස් ඇති
- ○ මහර දැනට ඇති ගැටලුව නිරාකරණය සඳහා රිමාන්ඩ් සිරකරුවන්ගේ කේන්ද්‍රගත ලේඛණයක් සැකසීම
- ○ රියදුරන් හා ආරක්ෂාව පිළිබඳ විස්තර ද ඇතුලුව සිරකරුවන් හා රිමාන්ඩ් සිරකරුවන් ප්‍රවාහනය කළ සියළු වාහන පිළිබඳව වාර්තාවක් සැකසීම.

**සුබසාධනය -** නොවැම්බර් 29 දින ප.ව. 4.30 ට සිරකරුවන්ට දිවා ආහාරය ලබා දී ඇති බව බළධාරීහු හා සිරකරුවෝ තහවුරු කරති. තවද, නොවැම්බර් 30 වන දින සිරකරුවන්ට ආහාර සැපයීමේ දී ගැටලු රැසක් ඇති වූ බවට අපට නිරීක්ෂණය විය. ආහාර සැපයුම, විදුලිය සහ ජල සැපයුම් ලබා දිම සඳහා විකල්ප පියවර ගනිමින් තිබූ බව අපට දැන ගැනීමට හැකි විය. කෙසේ වුවද, මේ සම්බන්ධයෙන් හදිසි අවස්ථා සැලසුම් නොපැවති බව පැහැදිලි විය. තවද, හෘදයාබාධ, මානසික සෞඛ්‍ය ගැටළු, දියවැඩියාව ඇතුලු විවිධ රෝගාබාධ වලට අවශ්‍ය ඖෂධ බොහෝ සිරකරුවන්ට නොලැබී තිබිණි. මේවා ප්‍රතිස්ථාපනය කර වෛද්‍ය සේවාවන් නැවත පණගැන්වීම අත්‍යාවශ්‍ය වේ.

- ○ ජල හා විදුලි සැපයුම නැවත ඇරඹීම හා විකල්ප සැපයුම් මාර්ග සැකසීම
- ○ ආහාර සැපයුම් නිසි වේලාවට පවත්වාගෙන යාම.

- ප්‍රතිකාර සේවා නැවත අරඹන තුරු රෝගී සිරකරුවන්ව අසල ඇති රෝහල්වලට මාරු කිරීම.
- දෛනිකව ඖෂධ ලබා දීම තහවුරු කිරීම.

ආ. **කෙටි කාලීන**

**පෙර සූදානම හා තීරණ ගැනීමේ ව්‍යුහයක් නොමැතිවීම** - කිසියම් තත්වයකට අදාළව මධ්‍යගත තීරණ ගැනීමේ ක්‍රමවේදයක් නොතිබි බව අපගේ නිරීක්ෂණයයි. කොවිඩ් 19 වසංගතයට ඇති බිය නිසා මෙම ස්ථානයේ ඇති වූ අසහනකාරී තත්වය පාලනය කිරිමට අපහසු බව අප විසින් හඳුනා ගැනිණි. කෙසේ වුවද, එවැනි ක්‍රමවේදයක් සැකසීම අත්‍යවශ්‍ය වේ. මේ සඳහා පිරිස් පාලනය කිරීමේ, සාකච්ඡා කිරීමේ කුසලතාවයන් සහිත සහ අවම බලය සම්බන්ධ උපදේශකයින් ඇතුළු විශේෂඥයින් ඇතුළත් විය යුතුය. එවැනි ක්‍රමවේදයක් සකසා තිබුනේනම් නොවැම්බර් 20/30 දිනවල අහිමිවූ ජීවිත වලින් වැඩි ප්‍රමාණයක් බේරා ගැනීමට හැකියාව තිබුනි.

- බන්ධනාගාර තුල ඇතිවිය හැකි අසහනකාරී තත්වයන් පාලනය කිරීම සඳහා මධ්‍යගත අණ දෙන මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම
- බන්ධනාගාර නිලධාරින්, පොලිසිය, වෛද්‍ය නිලධාරින්, ප්‍රතිපත්ති සම්පාදකයන් හා සිරකරු අයිතිවාසිකම් සංවිධාන සහ තීරණයකට එළැඹෙන තෙක් සිරකරුවන් තම මැදිරි වලට යැවීමට සහාය විය හැකි හා අවබෝධය සහිත මානසික සමාජ ප්‍රවීණතාවෙන් සමන්විත කාර්යසාධන බලකායක් සැකසීම.
- සිරකරුවන් වෙත කථා කිරිමට භාවිතා කළ හැකි හදිසි සන්නිවේදන පහසුකම් ඉදිරියේදී එක් එක් රැඳවුම් මධ්‍යස්ථානවල ඇති කිරීම
- පවුල්වල සාමාජිකයන් වෙනුවෙන් හදිසි දුරකථන සබඳතාවයක් ඇති කිරිම.

**පරීක්ෂණය** - අප එහි ළඟා වන විට බන්ධනාගාරයේ ඉතාමත් කලහකාරි තත්ත්වයක් පැවතිණි. මහචාර්ය. අනුරුද්ධ් එදිරිසිංහ ප්‍රමුඛ අධිකරණ වෛද්‍ය කටයුතු පිළිබඳ කණ්ඩායම සහ රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය මධ්‍යාහ්නය වන විට එම ස්ථානයට පැමිණ සිටියද කඩිනම්ව පරීක්ෂණයක් කළ හැකි තත්වයක් නොතිබුණි. මෙම සිද්ධියට අදාළ මූලික හේතු සහ අතුරු ප්‍රතිඵල අවබෝධ කර ගැනීමට අදාළ සියළු පාර්ශ්ව සම්බන්ධ කරගෙන අතිරේක පරීක්ෂණයක් පැවැත්විම ඇති වී ඇති අසහනකාරී තත්වය වළක්වාලීම සඳහා අත්‍යවශ්‍ය වේ.

- පරිශ්‍රය තුල අධිකරණ වෛද්‍ය පරීක්ෂණය ඇරඹීම සහ මිය ගිය පුද්ගලයන්ගේ සහ තුවාලවල ස්වභාවය වටහා ගැනීම සඳහා පශ්චාත් මරණ පරීක්ෂණ පැවැත්විම.
- බන්ධනාගාර පද්ධතිය වෙත පවතින බලපෑම් වල ස්වභාවය සහ කොවිඩ් 19 නිසා ඇති වූ තර්ජනයන් අවබෝධ කර ගැනීම ඇතුළු කරුණු සඳහා අධිකරණමය අධික්ෂණය යටතේ සිදුවිම් පිළිබඳව කඩිනම් පරික්ෂණයක් පැවැත්විම.

ඇ. **මධ්‍යකාලීන**

**බන්ධනාගාර නිලධාරීන් පුහුණු කිරීම** - මෙම තත්වය මින් පෙර සිදු නොවූවක් බව අප පිළිගන්නා අතර, මෙවන් තත්වයක් පාලනය කර ගන්නා ආකාරය පිළිබඳව බන්ධනාගාර නිලධාරීන්ට පුහුණුවක් දැඩි ලෙසම අවශ්‍ය වන බව අපට නිරීක්ෂණය විය.

- ගිනි අවි භාවිතා නොකර කැරළි හා ප්‍රාණ ඇපයට ගැනීමේ තත්වයන් පාලනය කිරීම.
    - පිරිස් පාලනය, ගිනි අවි භාවිතය පිළිබඳ මාර්ගෝපදේශ ලබාදීම සහ බන්ධනාගාර හා රැඳවුම් මධ්‍යස්ථාන සියල්ල සඳහා ජල සැපයුම් හා වෛද්‍යාධාර වැනි හදිසි සේවා සැපයීම් වැඩිදියුණු කළ යුතුය.

- මානව හිමිකම් පිළිවෙත් හා ප්‍රතිපත්ති වලට අනුකුලව රැඳවියන් සම්බන්ධයෙන් කටයුතු කිරීම.

- **මානසික සමාජමය සහාය -** ඇති වූ සිද්ධි මගින් සිරකරුවන් හා නිළධාරින් වැඩි දෙනෙකු දැඩි ලෙස මානසික පීඩාවට ලක්ව ඇති බවත්, සිදූ වූ තුවාල වලට අදාළ නොවන එහෙත් ආශ්වාස ප්‍රාශ්වාස කිරීමේ අපහසුතා සහ වෙනත් ශාරීරික දුබලතා ඇති වී ඇති බව ඇතැම් අය දැන්විය. රාත්‍රියේ මරණයට පත්වූ තම "සහෝදරවරුන්" පිළිබඳ විස්තර කිරීමට සිරකරුවන්ට අපහසු විය. මෙම සිදුවීමේ දිගුකාලීන බලපෑම් අවම කර ගැනීමට නම් මානසික සමාජ මැදිහත්වීමක් අවශ්‍ය වේ.

  - හදිසි සහාය අවශ්‍ය බව දන්වන නිලධාරීන්ට හෝ සිරකරුවන්ට ඒවා ලබාදිම;
  - මානසික සමාජ අවශ්‍යතා පිළිබඳ මූලික අනුරූපණයක් සිදු කිරිම හා ඉන් අනතුරුව අදාළ නිර්දේශ ක්‍රියාවට නැංවිම;
  - අවශ්‍යතාවය අනුව රෝගීන් වැඩිදුර ප්‍රතිකාර සඳහා අසල පිහිටි රෝහල් වෙත යැවිම.

**ඈ. දිගුකාලීන**

**මත්ද්‍රව්‍ය භාවිතය -** මහර රඳවා සිටින රිමාන්ඩ් සිරකරුවන්ගෙන් 80% පමණ මත්ද්‍රව්‍ය වලට සම්බන්ධ චෝදනාවලට ලක්වූවන් ය. ඉන් බොහෝ දෙනෙකු නැවත නැවතත් බන්ධනාගාර ගත වූ පිරිස් බව පෙනුණි. බළධාරීන් විසින් මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහිවූවන්ව ව්‍යාපාරයක් ලෙස නීතිවිරෝධි මත්ද්‍රව්‍ය අලෙවි කරන සාමාන්‍ය සිරකරුවන්ගෙන් වෙන් කර තැබීම වැදගත් වේ. මෙහිදි අපගේ නිර්දේශ වන්නේ,

- මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වී ඇති සැකකරුවන්ව බන්ධනාගාරගත කිරීම වෙනුවට පුනරුත්ථාපනය සඳහා යොමු කිරීම.
- මෙම පුනරුත්ථාපන මධ්‍යස්ථාන බන්ධනාගාර දෙපාර්තමේන්තුව මගින් නොව අන්තරායාකර ඖෂධ පාලන ජාතික මණ්ඩලය මගින් පාලනය කිරීම.

**විකල්ප දණ්ඩන නියම -** අපරාධ යුක්ති පද්ධතිය තුළ සිරගත කිරීම අවශ්‍ය නොවන වෙනත් දඩුවම් දීමේ විකල්ප රැසක් ඇත. මෙම විකල්ප පහත ආකාරයට ක්‍රියාවට නැංවිමේ දැඩි අවශ්‍යතාවයක් පැන නැගී ඇත.

- මේ සම්බන්ධව වෙනම අධිකාරියක් පිහිටුවිම;
- අත්‍යාවශ්‍ය යටිතල පහසුකම් ඇති කිරිම;
- මෙම විකල්ප ක්‍රමවේද පිළිබඳව අධිකරණ නිලධාරින්ට විශේෂ පුහුණුවක් ලබාදිම;

මෙම අතුරු නිර්දේශ මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 10 (ඇ) සහ (ඈ) වගන්ති වලට අනුව රජයට නිර්දේශ ඉදිරිපත් කිරිමට කොමිෂන් සභාවට ඇති බලය මත නිකුත් කෙරේ. මෙම අවස්ථාව මෙවැන්නක් යළි ඇති නොවිමට සියළු බළධාරින් තම දැනුම ඒකරාශි කර ක්‍රියා කළ යුතු සංකිර්ණ අවස්ථාවකි. එබැවින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව, වෛද්‍ය හා මානසික සමාජ විශේෂඥයින් සහ සිරකරු අයිතිවාසිකම් සම්බන්ධ සංවිධාන ඇතුළත්ව මාර්ග සිතියමක් සැකසීමේ අරමුණින් පොදු සාකච්ඡාවක් අරඹන ලෙස අපි රජයට කඩිනමින් දන්වා සිටිමු.

අත්. කළේ

රමණි මුත්තෙට්ටුවේගම
විමර්ශන සහ විමසීම් පිළිබඳ කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව